**ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනය - 2019**

**-------------------------------------------**

**1. මූල්‍ය මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1. මතය ප්‍රකාශනය**

**------------------**

ශ්‍රී ලංකා මල්ලවපොර සම්මේලනයේ ("සම්මේලනය") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් විසින් මට සහාය වන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි සපයා ගැනීමට මා හට නොහැකි විය.

**1.2. මතය ප්‍රකාශනය සඳහා පදනම**

**---------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ප්‍රකාශනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සම්මේලනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සම්මේලනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සම්මේලනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සම්මේලනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

---------------------

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කර විගණන වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේ වෙතත්, මතය වියාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

--------------------------------------------------------------------

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

-------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම් ක්ෂයවීම් රු. 288,640 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සම්මේලනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව මූල්‍ය ප්‍රකාශනවල ක්ෂයවීම් හඳුනාගත යුතුය. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

------------------------------------------

| විගණන නිරීක්ෂණය | වටිනාකම රු. | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස්ප දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | 3,677,818 | භෞතික සත්‍යාපන වාර්තා සහ ස්ථාවර වත්කම් ලේඛනය | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි | ජංගම නොවන වත්කම් සත්‍යාපනය සඳහා ප්‍රමාණවත් ලේඛන විගණනය වෙත ලබාදිය යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

**1.6.1 ලැබිය යුතු**

-------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නයිජීරියා මල්ලවපොර සම්මේලනයෙන් ලැබිය යුතු රු. 52,8000ක මුදලක් වර්ෂ 03ක සිට අයකරගෙන නොගෙන හෝ අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට හෝ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු
---------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු. 125,896 ක් වූ උපචිත වියදම් වර්ෂ 03කට වැඩි කාලයක සිට නොගෙවා තිබූ අතර ශේෂ සනාථ නොකිරීම හේතුවෙන් එය විගණනයේදී තහවුරු කරගැනීමට නොහැකි විය. | සම්මේලනයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වගකීම් තහවුරු කරගැනීමෙන් අනතුරුව ගෙවීම් පියවීමට කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය
-----------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 546,667 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 481,448 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 65.219 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු. 2,117,180 කින් හා මුළු වියදම රු. 2,182,399 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා හේතු වී තිබුණි.